සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

**පළමු වාර පරීක්ෂණය 2018** **6 ශ්‍රේණිය**
**முதலாம் தவணைப் பரீட்சை 2018** **தரம் 6**
**First Term Test 2018** **Grade 6**

**කතෝලික ධර්මය -I කොටස**
**Catholic**

**පැය දෙකයි**
***Two hours***

01 වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න

1. කිතුනු අපගේ ජීවිතයේ විශ්වාසයේ හා බලාපොරොත්තුවේ පදනම වන්නේ,
   I).නව ගිවිසුම II). පුරාණ ගිවිසුම III). මහෝපදේශය IV). ශුද්ධ බයිබලය
2. නව ගිවිසුමේ ඇතළත් ග්‍රන්ථ 27 න් පළමු ග්‍රන්ථ හතර ....................යනුවෙන් හැඳින් වේ.
   I).සංකේත II). නික්මයාම III). පංච පුස්තකය IV). ශුභාරංචි
3. දෙවියන් වහන්සේ තුන්වන දින මවන ලද්දේ ,
   I).ගොඩබිම හා ගස්කොලන් II). අහස හා ජලය III). ඉර,හඳ හා තාරකා IV). සතුන් හා මිනිසා
4. හේබ්‍රෙව් භාෂාවෙන් ''ටෝරා'' ලෙස නම් කරන්නේ ,
   I). ශුද්ධ බයිබලයයි II). නික්මයාමයි III). උත්පත්ති පොතයි IV). පංච පුස්තකයයි
5. මාක් තුමාගේ ශුභාරංචියේ සංකේතය වන්නේ,
   I). මිනිසාය II).ගවයාය III). සිංහයාය IV). රාජාලියාය
6. දෙවියන් වහන්සේ මිනිසාව මැවුවේ,
   I). එක් එක් ජාතීන් අනුව II).එක් එක් භාෂා අනුව III). එක් එක් ආගම් අනුව IV).දේව ස්වරූපය අනුව
7. "මරියාවෙනි බිය නොවන්න.ඔබ දෙවියන්ගෙන් වරප්‍රසාද ලද්දෙහිය." මෙම ප්‍රකාශය කරන ලද්දේ,
   I). දෙවියන් වහන්සේය II). මිචායෙල් දේව දූතයාය III).ගාබ්‍රියෙල් දේව දූතයාය IV). රෆායෙල් දේව දූතයාය
8. මහළුවියේදී පුතකු පිළිසිඳගත් මරියතුමියගේ ඥාතිවරිය වූයේ ,
   I). එලිසබෙත් තුමියය II). මරියාය III). මාර්තාය IV). ආනාතුමියය
9. සියලු මැවිලි වල පාලනය දෙවියන් වහන්සේ ......................සතු කළ සේක.මෙහි හිස්තැනට සුදුසු වචනය වන්නේ,
   I). පාලකයන් II). ආදම්- ඒව III). මිනිසා IV). ලෝකයා
10. ජේසුස් වහන්සේගේ උපත ගැන ප්‍රකාශ කළ දිවැසිවරයා වන්නේ,
    I). යෙසායා දිවැසිවරයාය II). මීකා දිවැසිවරයාය III). ජෙරමියා දිවැසිවරයාය IV). එසකියෙල් දිවැසිවරයාය

(ලකුණු 2 X 10 = 20)

02. පහත සඳහන් ප්‍රකාශ හරි නම් (√ ) ලකුණද වැරදි නම් ( X ) ලකුණද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න

1 ආරම්භයේ දී පොළව හිස්ව පාළුව තිබිණ. (.....................)

2.වරදට නැඹුරු වූ මිතුරන් එයින් මුදවා ගත යුතු නැත (......................)

3.පාසල තුළ අපේ මෙහෙවර වන්නේ ඉගෙන ගැනීම පමණකි. (......................)

4.ජේසු කුමරු ජෙරුසෙලම් දේව මාළිගාවේ පඬිවරුන් මැද සිටි සේක. (......................)

5.දේව මැවිල්ල රැකගැනීම අපගේ යුතුකමකි. (......................)

6. දේව දරුකම අපට ලැබෙන්නේ දිව්‍ය සත්ප්‍රසාදය මගිනි (......................)

7.ශු.ජොහාන් තුමා ජාකොබ් තුමාගේ සහෝදරයෙකි. (......................)

8. ජේසුස් වහන්සේ දාවිත්ගේ වංශයට අයත් කෙනෙකු නොවේ. (......................)

9. දේව මැවිල්ලේ උතුම්ම අංගය මහ පොළවය. (......................)

10.ඉශ්‍රායෙල් ජනයා පොරොන්දු දේශය කරා ගෙන ගියේ මෝසෙස් තුමාය. (......................)

(ලකුණු 1 X 10 = 10)

03. හිස්තැනට සුදුසු ප්‍රකාශය වරහන් තුළින් තෝරා තිත් ඉරි මත ලියන්න.

නුඹලා ...................................... ලබා වැඩී වර්ධනය වී ......................................පැතිර එය ...................................... ගන්න.

ආබ්‍රහම් බිය නොවන්න .නුඹ රක්නා ...................................... මේ ය. නුඹේ වාසනාව ......................................

(පලිහ,පොළව පුරා,දරු සම්පත්,විශාලය,යටත් කර )

(ලකුණු 2 X 5 = 10)

## II.කොටස

පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

01. I. ශුද්ධ බයිබලයේ පුරාණ ගිවිසුමට හා නව ගිවිසුමට අයත් පොත් සංඛ්‍යාව වෙන වෙනම දක්වන්න. (ල. 04)

II. ශුද්ධ බයිබලය පිළිබඳ කරුණු 03 ක් ලියන්න. (ල. 06)

02. I. ශුද්ධ බයිබලයේ පළමු පොත් 05 හඳුන්වන වෙනත් නම් දෙකක් ලියන්න. (ල. 04)

II. උත්පත්ති පොතේ ඇතුළත් කරුණු 03 ක් කෙටියෙන් ලියන්න. (ල. 06)

03. I. ශුභාරංචි යනුවෙන් හඳුන්වන්නේ කුමක්දැයි විස්තර කරන්න. (ල. 04)

II. ශුභාරංචි කතුවරු තිදෙනෙකු පිළිබඳ එක් කරුණ බැගින් ලියන්න. (ල. 06)

04. I. පළමු දිනය -

සයවන දිනය -

දෙවියන් වහන්සේ මැවූ මැවිලි නම් කරන්න(ල. 04)

II. මෙවැනි ලස්සන මැවිල්ලක හිමිකරුවන් බවට අප පත් කළ දෙව් පියාණන්ට තුති පුදා කෙටි යාච්ඤාවක් ලියන්න (ල. 06)

05. I. දෙවියන් වහන්සේ මිනිසා මවා මිනිසාට පැවරූ වගකීම් දෙකක් ලියන්න (ල. 04)

II. මැවිල්ල ආරක්ෂා කිරීමට ඔබට කළ හැකි කාර්යයන් 03 ක් ලියන්න (ල. 06)

06. I. මිනිසා අන් මැවිලි වලට වඩා උතුම් වීමට හේතු දෙකක් ලියන්න (ල. 04)

II. එකිනෙකාට ගරු කරමින් සමගියෙන් ජීවත් වීමට පාසලේදී ඔබට කළ හැකි කාර්යයන් 03 ක් ලියන්න (ල. 06)